
# හඳුනාගන්න !

## ආචාර්ය අබ්දුල් කලාම්

**නම:** අවුල් පාකීර් ජයනුල්අබ්දීන් අබ්දුල් කලාම් (ඒ.පී.ජේ. අබ්දුල් කලාම්).
**උපත:** 1931 ඔක්තෝම්බර් 31 එවකට බ්‍රිතාන්‍ය ඉන්දියාවේ මදුරාසි ප්‍රේසිඩන්සී හී රාමේෂ්වරම් හී පාම්බන් දූපතෙහි, රාමනද් දිස්ත්‍රික්කය. මෙකළ - ඉන්දියාවේ ටැමිල්නාඩු හී රාමනාත්පුරම් දිස්ත්‍රික්කය
**ජාතිය:** ඉන්දියානු (දෙමළ)
**ආගම:** ඉස්ලාම්
**මව:** ජයනුල්අබ්දීන් අෂිඅම්මා
**පියා:** ජයනුල්අබ්දීන් මර්ක්නුයාර්
**විවාහක තත්වය:** අවිවාහකයි
**අධ්‍යාපනය:** - ශාන්ත ජෝසප් විද්‍යාලයය
- තිරුචිරාප්පල්ලි
- මදුරාසි තාක්ෂණ ආයතනය
**හැදෑරීම:** භෞතික විද්‍යාව
ගුවන් අභ්‍යවකාශ ඉංජිනේරු විද්‍යාව
**අන්වර්ථ නාම:** මිසයිල මැන්
ජනතා ජනාධිපති
**වෘත්තිය:** ඉන්දියාවේ 11වන ජනාධිපති, 2002-2007
මහාචාර්ය
දේශක
ග්‍රන්ථ කතෘ
**ප්‍රමුඛ සේවය:** ඉන්දියාවේ ආරක්ෂක පර්යේෂණ සහ සංවර්ධන ආයතනය
ඉන්දියාවේ අභ්‍යවකාශ පර්යේෂණ ආයතනය
මිසයිල සංවර්ධනය
අභ්‍යවකාශ යානා අභ්‍යවකාශගත කිරීමට අවශ්‍ය රොකට් යානා (ලොන්ච් වෙහිකල්) සංවර්ධනය
පොකරන් II - න්‍යෂ්ටික පර්යේෂණ
**පිදුම් ලද සම්මාන:** ලොව පුරා විශ්වවිද්‍යාලය 40කින් ලැබූ ගෞරව උපාධි ඇතුළු ජාත්‍යන්තර සම්මාන සමූහයක්.
ඉන්දියාව - පද්ම භූෂාන් 1981
පද්ම විභූෂණ 1990
භාරත රත්න 1997
2011 දී නාසා ආයතනයේ වොන් බ්‍රෝන් සම්මානය
**විපත:** වයස 83දී හෘදයාබාධයකින්. 2015 ජූලිමස 27 දින ඉන්දියාවේ මෙයහලය හී ෂිලොන් හී දී දේශනයක් අතරතුර.



### ආචාර්ය අබ්දුල් කලාම්ගේ සරු කියමන්

**1.** සෑම දවසකම උදෑසන මෙම පද 5, 5 වරක් මෙනෙහි කරන්න.
i හොඳම තැනැත්තා මමයි.
ii එය මට කළ හැකිය.
iii දෙවියන් සැම විටම මා සමගය.
iv මා ජයග්‍රාහකයෙකි.
v අද මගේ දවසයි.

**2.** ශිෂ්‍යයකු සතු විය යුතු වැදගත්ම ලක්ෂණය වන්නේ ප්‍රශ්න ඇසීමට ඉදිරිපත් වීමය. එහෙයින් ප්‍රශ්න ඇසීමට ශිෂ්‍යයන්ට ඉඩදෙන්න.

**3.** අනාගත සාර්ථකත්වය සඳහා මුල්වන්නේ නිර්මාණශිලීත්වයය. ප්‍රාථමික අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන් නිර්මාණශිලීත්වයට යොමුකිරීම ගුරුවරුන් විසින් කළ යුතුය.

**4.** ඔබගේ සම්බන්ධවීමකින් තොරව ඔබට සාර්ථක විය නොහැකිය. ඔබගේ සම්බන්ධතාවය ඇතිවිට ඔබ අසාර්ථකවීමට ඉඩක් නැත.

**5.** ඔබට හිරු මෙන් බැබළීමට අවශ්‍ය නම් හිරු මෙන් දැවිය යුතුය.

**6.** සාර්ථක වීම සඳහා මා තබා ඇති අධිශ්ඨානය ශක්තිමත් නම් අසාර්ථකත්වයට කිසිදිනක මා අබිබවා යා නොහැකි වනු ඇත.

**7.** ප්‍රථම ජයග්‍රහණය ලැබූ පසු විවේක ගැනීමට නොයන්න. දෙවන උත්සහයේදී ඔබ අසාර්ථක වුවහොත් මුල් ජයග්‍රහණය වාසනාව නිසා ලැබුවක් බව මුමුණන දෙතොල් බොහෝ විය හැකිය.

**8.** මිනිසාට දුෂ්කරතා පැවතීම අවශ්‍යය. ඒ සාර්ථකත්වය භුක්ති විඳීමට දුෂ්කරතා අවශ්‍ය හෙයිනි.

**9.** මා සිතන අන්දමට මෙලොව දෙවර්ගයක මිනිසුන් සිටිති. ඒ තරුණ සහ අත්දැකීම් සහිත අය වශයෙනි.

**10.** කෙනෙකු පරාජය කිරීම ඉතා පහසුය එහෙත් කෙනෙකු දිනා ගැනීමට ඉතා අසීරුය.

**11.** සිහින දකින්න..! සිහින දකින්න....!! සිහින දකින්න....!! සිහින සිතුවිලිවලට පරිනාමනය වෙයි. සිතුවිලිවල ප්‍රතිඵලය ක්‍රියා කිරීමය.

**12.** සිහින සැබෑවීමට පළමුව ඔබ සිහින දැකීම අවශ්‍යය.

**13.** විශිෂ්ඨත්වය හදිසියේ උරුමවන්නක් නොව දිගින් දිගටම සිදුවන ක්‍රියාවලියකි.

**14.** ජීවත්වීම යනු අසීරු ක්‍රීඩාවකි. පුද්ගලයකු වීම සඳහා ඔබ සතු ජන්ම හිමිකම සුරැකීමෙන් පමණක් ඔබට එය ජයගත හැකිය.

**15.** අප සියල්ලෙනා සතුවම එක හා සමාන නිසැගියාවන් නොතිබිය හැකිය. එහෙත් අප සියලු දෙනාහටම අපගේ නිසැගියා වර්ධනය කරගැනීමට සමාන අවස්ථා ඇත.



**16.** ජීවිතයේදී ඔබ මුහුණ දෙන දුෂ්කරතා පැමිණ ඇත්තේ ඔබට විනාශ කිරීමට නොව, ඔබ තුළ සැගවී ඇති විභවමය හැකියා සහ ශක්තිය හෙළිදරව් කිරීමටය. ඔබද අමාරුකාරයෙක් බව දැනගැනීමට දුෂ්කරතාවලට ඉඩහරින්න.

**17.** එක හොඳ පොතක් හොඳ මිතුරන් දහසකට සමානය. එක හොඳ මිතුරෙක් පුස්තකාලයකට සමානය.

**18.** සියළු කුරුල්ලන් වැසි වැටෙන විට ආවරණයක් සොයා යති. එහෙත් රාජාලියන් වැස්සෙන් බේරීම සඳහා වලාකුළුවලට ඉහළින් පියාඹති. ගැටළු ඇතිවීම සාමාන්‍යය. වෙනසට මුල්වන්නේ ආකල්පය.



**19.** සිහින යනු ඔබ නින්දේදී දකින දෙයක් නොව ඔබට නිදා ගැනීමට ඉඩ නොදෙන දෙයකි.

**20.** සමහර අවස්ථාවලදී පන්තිය මගහැර මිතුරන් සමග විනෝදයෙන් ගත කිරීම හොඳය. මා ආපසු හැරී බලන විට මගේ මුවගට සිනහවක් නගන්නේ මා ලැබූ විෂය ලකුණු නොව එවැනි මතකයන්ය.

**21.** සෑම තරුණයෙකුටම තමන් අද්විතිය පුද්ගලයකු වීමට අවශ්‍ය බව පෙනේ. එහෙත් අධ්‍යාපනය ඇතුළු අප වටා පවතින සියළු දෙයක්ම දිවා රෑ වෙහෙසෙනුයේ ඔබවද අන්අය ලෙසම තැබීමටය.

**22.** ඔබගේ හොඳම ගුරුවරයා වන්නේ ඔබ අතින් අන්තිමට සිදුවූ අත්වැරැද්දය.

**23.** ඔබගේ අනාගතය ඔබට වෙනස් කළ නොහැක. එහෙත් ඔබට ඔබගේ හුරු - පුරුදු වෙනස් කළ හැකිය. පුරුදුවලට ඔබගේ අනාගතය වෙනස් කිරීමට පුළුවන.

**24.** අසාර්ථකභාවය නම් රෝගය සුව කිරීම සඳහා වන හොඳම බෙහෙත විශ්වාසය සහ වෙහෙස නොබලා වැඩ කිරීමය. එමගින් ඔබට සාර්ථක පුද්ගලයකු විය හැකිය.

**25.** සාර්ථකවීම් විස්තර කරන කතාන්දර කියවීමෙන් ඔබට ලැබෙන්නේ පණිවිඩයක් පමණය. එහෙත් අසාර්ථක වීම් විස්තර කරන කතාන්දර කියවීමෙන් සාර්ථකත්වය ලඟාකරගැනීම සඳහා යම් අදහසක් ලබාගැනීමට හැකිවනු ඇත.

**26.** ශ්‍රේෂ්ඨ සිහින දකින්නන් දකින මහා සිහින සැමවිටම උත්කෘෂ්ඨය.

**27.** රටක් දූෂණයෙන් තොරවීමට නම් සහ ජාතියක් පිවිතුරු සිත් ඇත්තන් ගෙන් යුතු වීමට නම්, එම වෙනස ඇති කළ හැකි තිදෙනෙක් අප අතර ඇත. ඒ පියා, මව සහ ගුරුවරයාය.

**28.** ඔබගේ මූලධන වත්කම විය යුත්තේ ඔබගේ සිතුවිලිය. ජීවිතයේදී මුහුණ දෙන සියළු උස්මිටිකම් පරයා ඔබට ජීවිතය සාර්ථක කරගැනීමට හැකිවනු ඇත.

**29.** ඉගෙනීම තුළින් නිර්මාණශිලීත්වය හිමිවෙයි. නිර්මාණශිලීත්වය, සිතීම තෙක් ව්‍යාප්ත වෙයි. සිතීම තුළින් දැනුම ලැබෙයි. දැනුම ඔබ විශාරදයකු කරයි.



**30.** තරුණ අයට මා දෙන පණිවුඩය නම් වෙනස් ආකාරයට සිතීමට ධෛර්යමත් වන්න. නවෝත්පාදන සිදුකිරීමට දිරිමත්වන්න. ගවේෂණය නොකළ මගක ගමන් කරන්න. සිදුකළ නොහැකි දේ සොයන්න. ගැටළු විසඳගෙන සාර්ථකත්වය ලබන්න. ඔබ උත්සාහ කළ යුත්තේ ඒ සඳහාය.

**31.** බලන්න දෙවියන් උදව් කරන්නේ මහන්සි වී වැඩකරන අයට පමණය. මෙය ඉතාම පැහැදිලි මූලධර්මයක්ය.

**32.** ඔබගේ කාර්යයෙහි සාර්ථකත්වය දැකීමට නම් ඔබ තැබූ ඉලක්කය වෙත එක සිතින් කැප විය යුතුය.

**33.** නායකයකු යනු කවරෙක් දැයි නිර්වචනය කිරීමට මට ඉඩදෙන්න. ඔහුට දැක්මක් සහ විලාසිතාවක් තිබිය යුතුය. ගැටළුවලට බිය නොවිය යුතුය. ඒ වෙනුවට පරාජය කරන්නේ කෙසේද යන්න දැන සිටිය යුතුය. ඉතාම වැදගත්වන්නේ කැපවීමෙන් හා සංයමයෙන් යුතුව ආත්ම විශ්වාසයෙන් කටයුතු කිරීමය.

**34.** හදවත යොමු නොකර වැඩ කළද ජයග්‍රහණය කළ හැකි වුවද මෙම හිස් ජයග්‍රහණය බොහෝ දෙනාට අමිහිරිය.

**35.** අධ්‍යාපනඥයන් විසින් විමසීම, නිර්මාණශිලීත්වය, ව්‍යවසායකත්වය සහ සදාචාරාත්මක නායකත්වය යන ගුණධාරිතාව වර්ධනය කරගෙන තම ශිෂ්‍යයන්ට මග පෙන්විය යුතුය.



**36.** අප කිසිවක් අත් හළ යුතු නැත. එසේම කිසිදු ගැටළුවකට අප පරාජය කිරීමට ඉඩ නොහළ යුතුය.

**37.** ඉහළට නැගීම සඳහා ශක්තිය අවශ්‍යය. එය එවරස්ට් කඳු මුදුන නැගීමට මෙන්ම වෘත්තියේ ඉහළට යාමටද එය අවශ්‍යය.

**38.** කුරුල්ලන් බලය ලබන්නේ ඔවුන්ගේම ජීවිතයෙන් සහ අභිප්‍රේරණයෙනි.

**39.** අහස දෙස බලන්න. අප එහි තනිව නැත. සමස්ත විශ්වයම අපට මිතුරුය. එය සිහින දකිමින් වැඩ කරන අය සඳහා ධෛර්යය සැපයීමට වෙරදරයි.

**40.** මා මිය යාමෙන් පසු නිවාඩු දිනයක් ප්‍රකාශයට පත් නොකරන්න. තවත් අමතර දවසක් වැඩ කරන්න.

**සැකසුම - තුසිත මලලසේකර**